සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය I** | **කාලය පැය 1 යි**

නම/ විභාග අංකයඃ

- 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ අංකයට ගැලපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01. ශුද්ධ බයිබලයට අයත් ඓතිහාසික කෘති දෙක වන්නේ,

(1) එස්රා හා සිරාක් ය. (2) තෝබිත් හා සිරාක් ය.
(3) එස්තර් හා බාරුක් ය. (4) රූත් හා එස්තර් ය.

02. දෙවියන් වහන්සේ තම වචනයේ බලයෙන් සිදුකළේ,

(1) ලෝකය ගැළවීම ය. (2) පාපයෙන් ගැළවීම ය.
(3) ලෝකය මැවීම ය. (4) පාපයට දඬුවම් දීම ය.

03. පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් තුළින් සනාථ වන්නේ,

(1) දෙවියන් වහන්සේ ලෝකය මැවූ ආකාරයයි.
(2) මිනිසා පාපයට වැටුණු ආකාරයයි.
(3) මිනිස් ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ ක්‍රියාකාරී වන බවය.
(4) ඊශ්‍රායෙල් ජාතියේ නැගීම හෝ වැටීම සිදුවූ ආකාරයයි.

04. නව ගිවිසුමට පමණක් අයත් පොත් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ලූක් සුවිශේෂය, ජාකොබ්, නික්මයාම
(2) ගලාති, ජුවාම් සුවිශේෂය, දානියෙල්
(3) මාක් සුවිශේෂය, එපිස, එළිදරව්ව
(4) පළමුවන ජොහාන්, මතෙව් සුවිශේෂය, ගීතාවලිය

05. ශුද්ධ වූ පාවුලු තුමා විසින්ම ලියන ලද සංදේශයකි,

(1) තිමති (2) තීතස් (3) එපීස (4) ගලාති

06. ශුද්ධ වූ පාවුලු තුමාගේ හසුන් වර්ගීකරණයට අනුව ආරූඪ කතෘත්වයෙන් යුතු හසුන් වන්නේ,

(1) II දෙවන තෙසලෝනික හා I තිමති ය. (2) I කොරොන්ති හා I තිමති ය.
(3) තීතස් හා එපීස ය. (4) රෝම හා පිලිප්පි ය.

07. යහපත් හා අයහපත් බලවේග අතර ගැටුමක් වන්නේ,

(1) යුගාන්තවාදයයි. (2) ද්විත්වවාදයයි. (3) සංකේත භාවිතයයි. (4) පරිණාමවාදයයි.

08. එළිදරව් සාහිත්‍යයේ 10 සංඛ්‍යාවෙන් සංකේතවත් වන්නේ,

(1) පරිපූර්ණත්වයයි. (2) විශ්වයයි. (3) පූර්ණත්වයයි. (4) ඉශ්‍රායෙලයයි.

09. ජීවිත හරය, එහි ගැටලු, විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහයක් වන්නේ .............. ප්‍රඥාවයි. හිස්තැනට සුදුසු වචනය තෝරන්න.

(1) පවුල හා ගෝත්‍රික (2) රාජ්‍ය සභා

(3) එදිනෙදා ජීවිතය සම්බන්ධ (4) අභිධාර්මික

10. ජේසුස් වහන්සේගේ මෘත ශරීරය කුරුසියෙන් බා, භූමදාන කටයුතු සිදුකිරීමට ඉදිරිපත් වන්නේ,

(1) මරිය මග්දලේනා ය. (2) ශුද්ධ පේදුරු තුමා ය.

(3) ශුද්ධ ජුවාම් තුමා ය. (4) අරමාතියේ ජෝශප් ය.

11. නව අහස හා නව පොළොව යන සංකල්පය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?

(1) ගීතාවලිය (2) නික්මයාම (3) සලමොන්ගේ ප්‍රඥාව (4) එළිදරව්ව

12. ‘පෙන්තකොස්ත’ යන්නෙහි අරුත කුමක් ද?

(1) පණහ (2) තුති දීම

(3) ශුද්ධ සභාවේ මංගල්‍යය (4) ශුද්ධාත්ම මංගල්‍යය

13. අපෝස්තුළුවරු දොළොස් දෙනා අතරින් පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා වන්නේ,

(1) ජාකොබ් තුමා ය. (2) ජුවාම් තුමා ය. (3) පේදුරු තුමා ය. (4) ඇන්ඩෘ තුමා ය.

14. ශුද්ධ පාවුළු තුමා සමඟ දෙවන ධර්මදූත චාරිකාව සඳහා සහභාගිවූවන් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - බර්ණබස් B - ජෝන් මාක් C - තිමෝතියස්

D - තීතස් E - සීලස් F - ලූක්

(1) A, B හා C (2) C, E හා F (3) B, C හා D (4) C, D හා F

15. ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ බෞතීස්ම නාමය වන්නේ,

(1) කැරොල් වොයටිල්ලා ය. (2) මාරියෝ හෝස් ය.

(3) ඩෙස්මන් ටුටූ ය. (4) ජෝර්ජ් මාරියෝ ය.

16. අපෝස්තුළුවරුන් හා වත්මන් ශුද්ධ සභාව අතර වන දූත කාර්යයෙහි අනන්‍යතාවය නම්,

(1) ඒකත්වයයි. (2) ශුද්ධත්වයයි.

(3) අපෝස්තලිකත්වයයි. (4) කතෝලිකත්වයයි.

17. ‘‘කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරියදෙයක් ඔහුගේ මරණ මොහොතේදී ඉටු කර ගත නොහැකිය’’ යි ප්‍රකාශ කළේ,

(1) ජුසේ වාස් පියතුමා ය. (2) තෙරේසා මව්තුමිය ය.

(3) දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියතුමා ය. (4) අති උතුම් පළමුවන ෆ්‍රැන්සිස් පියතුමා ය.

18. ‘‘දේව ප්‍රසාද නිධානයන්ගේ දේව ප්‍රසාද නිධානය’’ වන්නේ,

(1) ප්‍රසාද ස්නාපනයයි. (2) දිව්‍ය සත්ප්‍රසාදයයි.

(3) අභිවෘද්ධි ආලේපයයි. (4) පූජකවරයයි.

The National e-learning Portal for The General Education

19. මෙල්කිසදෙක්ගේ යාගය,

(1) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණයකි.

(2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණකි.

(3) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සිහිකිරීමකි.

(4) දිව්‍ය සත්ප්‍රසාදීය ඉගැන්වීමකි.

20. මුල් කිතුණු සංඝය තුළ ප්‍රේමය හා සේවය අතපසු කරමින් දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගි වී ඇති බවත්, එසේ කිරීම නුසුදුසු බවත්, ශුද්ධ වූ පාවුලු තුමා අනුශාසනා කළේ,

(1) එපීස සභාවට ය. (2) ගලාති සභාවට ය.

(3) කොරෙන්ති සභාවට ය. (4) රෝම සභාවට ය.

21. නොදවන පූජා සඳහා යොදා ගන්නේ,

(1) කුරුල්ලන් ය. (2) පිටි ය. (3) පරවියන් ය. (4) බැටළුවන් ය.

22. 2015 දෙසැම්බර් 08 න් ආරම්භ වූයේ,

(1) මරිය වසර ය. (2) දයා කරුණාවේ වසර ය.

(3) විශ්වාසයේ වසර ය. (4) තරුණ වසර ය.

23. අත්‍යන්ත වූද අපිරිමිත වූ ද සදාතනික වූ ද අමිල යාගය,

(1) දවන යාගයයි. (2) කල්වාරි යාගයයි. (3) එළියාගේ යාගයයි. (4) ආබ්‍රහම්ගේ යාගයයි.

24. ''මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව'' ආරම්භ කළේ,

(1) මර්සලින් ජයකොඩි පියතුමා ය. (2) තෙරේසා මව්තුමිය ය.

(3) මැක්ෂිමිලියම් කෝල්බේ පියතුමා ය. (4) ජුසේ වාස් පියතුමා ය.

25. පූජක සේවය ජනතා හද ගැස්මට ළංවන අයුරින් ගොඩනැගීමට ''සේවක සෙවණ'' නැමති ස්ථානයේ දෙව්සත්හලක් පවත්වාගෙන ගිය පූජකතුමා වන්නේ,

(1) මයිකල් රුද්‍රිගු පියතුමා ය. (2) මැක්ෂිමිලියම් කෝල්බේ පියතුමා ය.

(3) මර්සලින් ජයකොඩි පියතුමා ය. (4) ජුසේ වාස් පියතුමා ය.

26. ''විද්‍යාවට අනුව දේවත්වය මිථ්‍යාවක් යැයි කීම'' කී වෙනි පනතට විරුද්ධ වේද?

(1) 3 පනතට (2) 4 පනතට (3) 2 වන පනතට (4) 1 වන පනතට

27. තමාටම තම ගැලවීම ලබාගත හැකි බවත්, සිත් හැරීමක් නැතිව ගැලවීම ලබාගතහැකි බවත් බලාපොරොත්තු වීම,

(1) අනුමානයයි. (2) බලාපොරොත්තු අධික වීමයි.

(3) ඇදහිල්ලයි. (4) ඉච්ඡාභංගත්වයයි.

28. පාවුලු තුමාගේ එපීස ලිපියට අනුව පොරොන්දුවක් ඇති පළමු ආඥාව වන්නේ,

(1) 'ඔබේ දෙව් ස්වාමින් වහන්සේට වන්දනා කරන්න' ය.

(2) 'බොරු නොකියා ඇත්ත පවසන්න' ය.

(3) 'ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න' ය.

(4) 'මාගේ පුත්‍රය පියාගේ අවවාදය අසන්න' ය.

29. තමාගේ සහෝදරයා සමග කෝප වන අය යටත් වන්නේ,

(1) අධිකරණයට ය. (2) විනිශ්චයට ය.

(3) ශ්‍රේෂ්ඨාධිකරණයට ය. (4) නිරාගින්නට ය.

30. පමණ ඉක්මවා තෙල්, සීනි හා ලුණු සහිත ආහාර ගැනීම කී වෙනි පනතට විරුද්ධ වේද?

(1) පළමුවන පනතට (2) දෙවන පනතට (3) පස්වන පනතට (4) හතරවන පනතට

31. දෙවියන් වහන්සේ අයහපත තුළින් යහපත උදාකරන බව තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි **ජීවිත සාක්ෂියකි,**

(1) ආබ්‍රහම් (2) ඊසාක් (3) ජෝසප් (4) ජාකොබ්

32. ''ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ, ඔබ තුළ වැඩ වසන...... මන්දිරය වන බව ඔබ නොදන්නහුද?'' යනුවෙන් පාවුලු තුමා පවසයි. හිස්තැනට සුදුසු වචනය තෝරන්න.

(1) දෙවියන් වහන්සේගේ (2) ශුද්ධාත්මයාණන්ගේ

(3) ක්‍රිස්තුන් වහන්සේගේ (4) පුත්‍රයාණන් වහන්සේගේ

33. කොපිකර, වංචාකර විභාග සමත්වීම,

(1) 8 වන පණතට විරුද්ධය. (2) 5 වන පණතට විරුද්ධය.

(3) 10 වන පණතට විරුද්ධය. (4) 7 වන පණතට විරුද්ධය.

34. ශුද්ධාත්මයාණන් රැවටීමට උත්සහ කිරීම නිසා තම ජීවිත අහිමිකර ගැනීමට සිදුවූ යුවලක් වන්නේ,

(1) ආදම් සහ ඒව ය. (2) ආබ්‍රහම් සහ සාරා ය.

(3) ඊසාක් සහ රෙබෙකා ය. (4) අනනියස් හා සපීරා ය.

35. ජනවන්දනා වර්ෂයට අයත් සති ගණන,

(1) 50 කි. (2) 53 කි. (3) 52 කි. (4) 54 කි.

36. ජනවන්දනා වර්ෂයේ අවසාන මංගල්‍යය වන්නේ,

(1) නත්තල් මංගල්‍යය යි. (2) පාස්කු මංගල්‍යය යි.

(3) ස්වර්ගාරෝහණ මංගල්‍යය යි. (4) ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය යි.

37. ආගමන සමය තුළ සමරන ණය මංගල්‍යයකි,

(1) මරියතුමියගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය

(2) නත්තල් මංගල්‍යය

(3) මරියතුමියගේ ස්වර්ගාරෝහණ මංගල්‍යය

(4) පරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය

38. දිව්‍ය පූජාවේදී දක්නට ලැබෙන මුලසුනේ යැදුමකි,

(1) විශ්වාසකයින්ගේ යැදුම් (2) ස්වාමීනි කරුණා කළ මැනව

(3) පොදු යැදුම (4) විශ්වාස ලක්ෂණය

39. ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේ වෙනුවෙන්ම සිදු කළ යාච්ඤාව වන්නේ,

(1) ස්වාමිවාක් ආරාධනාවයි. (2) උත්තම පූජක යාච්ඤාවයි.

(3) මල් උයනේ යාච්ඤාවයි. (4) විශ්වාස ලක්ෂණයයි.

40. මල් උයනේ යාච්ඤාව මගින් අපට ඉදිරිපත් කරන ප්‍රබල පණිවිඩය වන්නේ,

(1) ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවකම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව ය.

(2) ප්‍රශ්න ගැටළු වලදී පමණක් යාච්ඤා කළ යුතු බව ය.

(3) ප්‍රීතිමත් අවස්ථාවලදී පමණක් යාච්ඤා කළ යුතු බව ය.

(4) තමන් අතින් වරදක් සිදුවූ විට යාච්ඤා කළ යුතු බව ය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය II** | **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) (i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත පිළිගන්වා ඇත්තේ කාටද? එහි කතුවරයා නම් කරන්න.

(ii) ශුද්ධ වූ තෙරේසා මව්තුමියව ශුද්ධවරයට එසවූ දිනය හා ස්ථානය ලියන්න.

(iii) සංදේශ වර්ගීකරණයට අනුව වෙනත් සංදේශ හඳුන්වන නම් දෙකක් ලියන්න.

(iv) සලමොන් රජතුමා පූජාසනයක් තැනූ ස්ථානය හා එහි කළ යාගය කුමක් ද?

(v) ලන්දේසි පාලන අවධියේ කතෝලිකයන්ට සිදුවූ පීඩා දෙකක් ලියන්න.

(vi) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් ලියන්න.

(vii) ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග දෙකක් ලියන්න.

(viii) තෙවන පනතට විරුද්ධව කරන ක්‍රියා දෙකක් ලියන්න.

(ix). ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය ස්වර්ගස්ථ වන අවස්ථාවේ තම මෑණියන්ට කළ ප්‍රකාශය කුමක් ද?

(x). දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20)

(02) (i) ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් පසු ව උන්වහන්සේ ව දර්ශනය වූ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) ජේසුස් වහන්සේ කුරුස ගසේදී වදාළ ශ්‍රී වාක්‍ය තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ස්වර්ග රාජ්‍යයේ දි උත්ථානවූ ජේසුස් වහන්සේ දැකීමට සුදුස්සන් වීම සඳහා ඔබට කළ හැකි ක්‍රියාවන් පහක් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) ශ්‍රී ලංකා ශුද්ධ සභා ඉතිහාසය බෙදෙන ප්‍රධාන යුග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පෘතුගීසි පාලන සමයේ මෙරට සේවය සඳහා පැමිණි පැවිදි නිකායන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා ශ්‍රී ලාංකීය කිතුණුවන්ට සිදු කළ සේවය අගයමින් බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න. (ලකුණු 05)

(04) (i) නව ගිවිසුමේ පඬුරත් පූජකයාත් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) දිව්‍ය පූජාවට නිසි ලෙස හා උනන්දුවෙන් සහභාගිවීමට ඔබට කළ හැකි ක්‍රියා පහක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) දෙවන පනතට විරුද්ධව කරන ක්‍රියා තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) දේව ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දැක්විය හැකි ආකාර පහක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) ජනවන්දනාවේ ප්‍රධාන අංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ජනවන්දනා වසරේ කාල වකවානු තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ඔබ මීසම තුළ ජනවන්දනා මෙහෙයන් අර්ථවත් කර ගැනීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් පහක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ශුද්ධ වූ තෙරේසා මව්තුමිය

(ii) ශුද්ධ වූ පාවුලු තුමා

(iii) ''එදිනෙදා ජීවිත ප්‍රශ්න වලට ශුද්ධ බයිබලයෙන් පිළිතුරු සොයමු.''

(iv) දිව්‍ය පූජාවේ මුදුන් මල්කඩ දිව්‍ය සත්ප්‍රසාදය වේ. (ලකුණු $5 \times 2 = 10$)

The National e-learning Portal for The General Education

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (4) | 02. (3) | 03. (3) | 04. (3) | 05. (4) | 06. (1) | 07. (2) | 08. (1) | 09. (4) | 10. (4) |
| 11. (4) | 12. (1) | 13. (1) | 14. (2) | 15. (4) | 16. (3) | 17. (1) | 18. (2) | 19. (2) | 20. (3) |
| 21. (2) | 22. (2) | 23. (2) | 24. (3) | 25. (1) | 26. (4) | 27. (1) | 28. (3) | 29. (1) | 30. (3) |
| 31. (3) | 32. (2) | 33. (4) | 34. (4) | 35. (3) | 36. (4) | 37. (1) | 38. (3) | 39. (2) | 40. (1) |

(ල. 40)

## II පත්‍රය

(01) (i) තියෝපිලස් තුමාට, ශුද්ධ ලූක් තුමා (10 පෙළ පොත පිටු 05)

(ii) 20160904, වතිකානය

(iii) කතෝලික සංදේශ, විශ්ව සංදේශ, සාමාන්‍ය හසුන් (පිටුව 08)

(iv) ගිබ්යොන්හි, දවන යාග පූජා (පිටුව 15)

(v) කතෝලික පියවරුන් රටින් පිටුවහල් කිරීම, අප්‍රසිද්ධියේ හෝ කතෝලික දහම ඇදහීම තහනම් කිරීම, දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් කිරීම. (පිටුව 39)

(vi) පූප කැඩීම, ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය, නව පාස්කු මංගල්‍යය, ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගිකම (පිටුව 46)

(vii) පාස්කු බැටළුවා, නුමුහුන් රොටී, තිත්ත පලා, මිදියුෂ (පිටුව 50)

(viii) ඉරුදින හා ණය මංගල දින දිව්‍ය පූජාවට සහභාගි නොවීම, දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගි නොවීම, දිව්‍ය පූජාව වේලාවේ අනවශ්‍ය කථාවේ යෙදීම. (පිටුව 73)

(ix) ''අම්මේ, මම පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුදා 'මරණයට පත් වුනත් මම මගේ දේව ජීවිතය නැති කර ගත්තේ නෑ' කියා ජේසුට දුන් පොරොන්දුව ඉටු කළා.'' (පිටුව 89)

(x) දේව වාක්‍ය පිළිවෙත, ස්තෝත්‍ර යාගික පිළිවෙත (පිටුව 113) (ලකුණු 02 × 10 = 20)

(02) (i) මග්දලාහී මරියාට, තෝමස් අපෝස්තුලුවරයාට (ල. 02)

(ii)
- ''පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව; ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති.''
- ''ඇත්තෙන්ම මම ඔබට කියමි. ඔබ මා සමඟ අද ම පාරාදීසයෙහි සිටින්නෙහිය.''
- ''පියාණෙනි, ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි.'' (පිටුව 20, 21) (ල. 03)

(iii) පාපී ක්‍රියාවලට පසුතැවීම, යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම, දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම, ජීවිත වෙනසක් ඇති කර ගැනීම, පරිත්‍යාගයෙන් ජීවත් වීම, අන් අයගේ දුකට පිහිට වීම ආදී පිළිතුරු (පිටුව 22) (ල. 05)

(03) (i) පෘතුගීසීන් පැමිණීමට පෙර අවධිය, පෘතුගීසීන් මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ අවධිය, ලන්දේසීන් මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ අවධිය, බ්‍රිතාන්‍ය යුගය, නිදහසින් පසු යුගය (පිටුව 37) (ල. 02)

(ii) ප්‍රැන්සිස්කාන ධර්මදූතවරු, ජේසු නිකායික ධර්මදූතවරු, දොමිනිකාන නිකායික ධර්මදූතවරු, අගුස්තීනු නිකායික ධර්මදූතවරු (පිටුව 38) (ල. 03)

(iii) ජුසේ වාස් මුනිතුමා කළ ප්‍රාතිහාර්යයන්, වසූරිය රෝගීන්ට උපස්ථාන කිරීම, ඉතා අල්පේච්ඡ දිවියක් ගත කිරීම, හිස් පතුළින් සේවයට කැපවීම ආදී කරුණු විස්තර කිරීම. (පිටුව 40, 41) (ල. 05)

(04) (i) පඬුර ක්‍රිස්තුන් වහන්සේ / පූජකයා ක්‍රිස්තුන් වහන්සේ (පිටුව 56) (ල. 02)

(ii) මෙල්කිසදෙක්ගේ යාගය, මන්නා භෝජනය, නුමුහුන් පූප අනුභවය හා කුසලානයෙන් පානය කිරීම, පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය (පිටුව 46, 47) (ල. 03)

(iii) හැකි සෑම විටම පාපොච්චාරණය කර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම, දිව්‍ය පූජාවේ ආරම්භයේ සිට අවසානය තෙක් සහභාගි වීම, යාච්ඤාවලට භක්තියෙන් සහභාගි වීම, හඬ නඟ ගීතිකා ගායනා කිරීම, සංවර ඇඳුමින් දිව්‍ය පූජාවට පැමිණීම, දිව්‍ය පූජාව ආරම්භ කිරීමට අවම වශයෙන් පැයක කාලයක්වත් ආහාරපාන වලින් වැළකීම. (පිටුව 53, 54) (ල. 05)

(05) (i) ඉච්ඡාභංගත්වය, අනුමානය (පිටුව 69) (ල. 02)

(ii) ලෞකික දේ ඉටු කර ගැනීමේ අදහසින් දෙවියන් නමින් දිව්රීම, තමා අතින් සිදු වූ පාපයන්, වැරදි දේව කැමැත්ත ලෙස සාධාරණීකරණය කිරීම, එදිනෙදා සිදුවීම් වලදී දෙවියන් වහන්සේට දොස් කීම, ශුද්ධ වූ දේ හා දේව වචනය, අගෞරව ලෙස භාවිත කිරීම, අන් අයට සාප කිරීම, අයහපත පැතීම. (පිටුව 71) (ල. 03)

(iii) දෙවියන් වහන්සේ කෙරෙහි පමණක් විශ්වාසය තබමින් උන්වහන්සේ තුළ පමණක් යැපීම, යාච්ඤාව තුළින් නිතරම දෙවිඳුන් හා සම්බන්ධ වීම, අසරණයා තුළින් අප වෙත පැමිණෙන ස්වාමීන් වහන්සේව හඳුනාගෙන පිහිට වීම, අපට ලැබී ඇති වරප්‍රසාද වලට දෙවිඳුන්ට තුති දීම, වගකීම් යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම. (ල. 05)

(06) (i) දිව්‍ය පූජාව, දේව ප්‍රසාද නිධාන, යාම යැදුම (පිටුව 105) (ල. 02)

(ii) ආගමන සමය, නත්තල් සමය, සාමාන්‍ය සමය පළමු අදියර, චතාරික සමය, පාස්කු සමය, සාමාන්‍ය සමය දෙවන අදියර (පිටුව 106) (ල. 03)

(iii) එදින සුබාරංචියට ගැළපෙන ලෙස ගීතිකා තෝරා ගැනීම, දිව්‍ය පූජාවට පෙර දෙව්මැදුර පිරිසිදු කිරීම හා අලංකාර කිරීම, නිසි සූදානමකින් යුතුව දේව වචනය ප්‍රකාශ කිරීම, අර්ථවත්ව විශ්වාසකයින්ගේ යැදුම් සූදානම් කර ගැනීම, පෙර පුහුණුවකින් යුතුව ගීතිකා ගායනා කිරීම, දේව වචනය ප්‍රකාශ කරන අය සුදු ඇඳුමින් සැරසී පැමිණීම. (ල. 05)

(07) i. (10 වසර පෙළ පොත 59, 60 පිටු)

ii. (10 වසර පෙළ පොත 26, 27, 29 පිටු)

iii. (10 වසර පෙළ පොත 1, 2 පිටු)

iv. (10 වසර පෙළ පොත 44, 45, 46, 47 පිටු) (5 x 2 = 10)

The National e-learning Portal for The General Education